Fact Research

# Port Cityයේ ඇත්ත කතාව



ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානය
தேசிய அபிவிருத்திக்கான ஊடக நிலையம்
Media Centre for National Development

ජනමාධ්‍ය අමාත්‍යාංශය
வெகுஜன ஊடக அமைச்சு
Ministry of Mass Media



# හැඳින්වීම

සංවර්ධනයක් අපේක්ෂා කරන ශ්‍රී ලංකාව වැනි සුපෝෂිත රටක කොළඹ වරාය නගරය හෙවත් Port City යනු රන් දොරටුවකි. නමුත් මෙම ව්‍යාපෘතිය පිලිබඳ බොහොමයක් මිථ්‍යා මත ගොඩනැගී ඇත. රටින් වෙනම කලාපයක් වෙන් කර ඇති බවත්, එහි නීතිමය පසුබිම ස්ථාවර නොවන බවටත් පවතින අසත්‍ය ඊනියා ප්‍රකාශයන් හමුවේ රජයක් ලෙස ජනතාවට සත්‍ය වටහා දීමේ වගකීම අප දරන්නෙමු.

# මොකක්ද මේ Port City යේ ඇත්ත?

කටකතා බලවත් වීමට පෙර රටවටා ගෙන යා යුතු සත්‍ය පැහැදිලි කිරීම් සරලව අප මෙලෙස ඔබ වෙත ගෙන එන්නෙමු.

- ඕනෑම රාජ්‍ය ආයතනයකට, කොමිසමකට ස්වකීය අරමුදල් පවතින ආකාරයටම වරාය නගර කොමිසමටත් අරමුදලක් පැවතීම සාමාන්‍ය දෙයක්

- වරාය නගරයේ අවසන් විගණන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බැවින් එය හොඳින් අධ්‍යනය කිරීමේ හැකියාව මහජන නියෝජිතයින්ට ලැබේ

- ලෝකය පිළිගත් ඕනෑම ව්‍යවහාරික මුදල් ඒකකයකින් වැටුප් පමණක් නොව භාණ්ඩ හා සේවා මිලදී ගැනීමටත් ලබා දීමටත් වරාය නගරය තුළ හැකි වනු ඇති

- විදෙස්ගතව විදේශ විනිමය ඉපයීම වෙනුවට මෙරට සිට උසස් වෘත්තීන්වල නිරත වෙමින් විදේශ විනිමය ඉපයීමේ යුගයක්



## මිථ්‍යා මතය

පසුගියදා ආණ්ඩුව තමන්ගේ 2/3 බලය උපයෝගී කරගෙන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව නමින් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළා.

## සත්‍යය

පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ආණ්ඩුවකට 2/3 බලයක් අවශ්‍ය නොවේ. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දු කරන හෝ වෙනත් විශේෂ අණපනත් සම්මත කර ගැනීමක දී හැර පනතක් සම්මත කර ගැනීමට සරළ පාර්ලිමේන්තු බහුතරයකින් වුවද හැකිය.

## මිථ්‍යා මතය

මේ කොළඹ නගරය ආසන්නයේ ඉදිකරන ලද වරාය නගරයේ අක්කර 1115ක භූමියෙන් 80%ක් චයිනා හාබර් සමාගමට අයිතියි.

## සත්‍යය

කොළඹ වරාය නගරයේ භූමි අවකාශය හෙක්ටයාර 269 ක් නැතහොත් අක්කර 664 ක් පමණි. නමුත් ඒ වටා ඉදිර කර ඇති දියකඩනය සහ දිය අගල ද ඇතුලත් සමස්ත අවකාශය හෙක්ටයාර 446 ක් නැතහොත් අක්කර 1102 කි.

**මෙකී සමස්ත භූමිය ශ්‍රී ලංකා රජයට සින්නක්කර අයිතිය සතු භූමියක් ලෙස පාර්ලිමේන්තු යෝජනා සම්මතයකින් ප්‍රකාශයට පත් කර ඇත.**

භූමි අවකාශයේ හෙක්ටයාර 269 න් ගොඩනැගිලි සෑදිය හැක්කේ හෙක්ටයාර 178 ක එනම් අක්කර 439 ක පමණි. සෙසු හෙක්ටයාර 91 නැතහොත් අක්කර 224 වෙන් වන්නේ මහාමාර්ග, වෙරළ තීර, උද්‍යාන, පදික තීරු, ඇල මාර්ග ආදී පොදු යටිතල පහසුකම් සඳහාය ගොඩනැගිලි ඉදිකල හැකි හෙක්ටයාර 178 න් ව්‍යාපෘති සමාගම වෙත 99 අවුරුදු බදු ලෙස ලැබෙනුයේ හෙක්ටයාර 116 ක් එනම් අක්කර 286 ක් පමණි. ඉතිරි හෙක්ටයාර 62 එනම් අක්කර 153 රජයට සෘජු පරිහරණය හෝ වෙනත් ඕනෑම පාර්ශවයකට ප්‍රතිබදු දීමේ හැකියාව ඇත.

ව්‍යාපෘති සමාගමට හිමි වන හෙක්ටයාර 116 ත් ඔවුන්ගේ පරිහරණයට වඩා ඉලක්ක ගත කෙරෙනුයේ තෙවෙනි පාර්ශවීය ආයෝජකයන් වෙත ප්‍රතිබදු ලබා දීමය. සමාගම මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් ආයෝජනය කරන එක්සත් ජනපද ඩොලර් බිලියන 1.4 ක මුදල ප්‍රතිපූරණය කර ගැනීමේ සැලසුම එයයි. ඒ අනුව ගත් කළ ව්‍යාපෘතියේ සමස්ත භූමි අවකාශය වන අක්කර 1102 න් සමාගම වෙත තාවකාලිකව හෝ ලැබෙනුයේ අක්කර 286 ක් පමණි.

**එය ප්‍රතිශතයක් ලෙස ගත් කළ 25% කි.**

**269** hectares
Reclaimed land from the sea

**178** hectares
Developable Land Area

**91** hectares
Public space

**109** hectares
Swimming Lagoon


**2** kilometers
Leisure beach

# මිථ්‍යා මතය

මෙම සමාගම පසුගිය කාලයේ රාජපක්ෂවරුන්ගේ මැතිවරණ වෙනුවෙන් හා අරමුදල් වෙනුවෙන් විශාල ලෙස මුදල් පොම්ප කළ බවට තොරතුරු ඉදිරිපත් වුණා. රටේ පොදු නීතියට යටත් නොවන කලාපයක් ලෙස නම් කරන ලෙසට මෙම සමාගමෙන් ආණ්ඩුවට දිගින් දිගට බලපෑම් එල්ල වී තිබුණා. සැබැවින්ම මේ පනත් කෙටුම්පත ඉදිරිපත් වන්නේ එහි ප්‍රතිඵලයක් ලෙසයි.

## සත්‍යය

2018 වසරේදී ඇමෙරිකා එක්සත් ජනපදයේ නිව්යෝක් නුවර කේන්ද්‍ර කරගත් පුවත්පතක් විසින් විකෘති කරන ලද තොරතුරු හා චීනය ලෝකය හමුවේ අපකීර්තියට පත් කිරීමේ චේතාන්විතව ගොතන ලද පුවතකින් චීන වරාය ඉංජිනේරු සමාගම වෙත ඉහත කී අවලාදය එල්ල කරන ලදී. එකී පුවත හා එහි සඳහන් අසත්‍ය කරුණු ප්‍රතික්ශේප කරමින් චීන වරාය ඉංජිනේරු සමාගමේ ඉහළ කළමනාකාරීත්වය එවක මෙරට සිටි චීන තානාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් විවෘත මාධ්‍ය හමුවක් පවත්වා කරුණු හෙළිදරව් කෙරිණි.


U.S. INTERNATIONAL CANADA ESPAÑOL 中文

The New York Times

By Maria Abi-Habib

June 25, 2018

阅读简体中文版 · 閱讀繁體中文版

HAMBANTOTA, Sri Lanka — Every time Sri Lanka's president, Mahinda Rajapaksa, turned to his Chinese allies for loans and assistance with an ambitious port project, the answer was yes.

Yes, though feasibility studies said the port wouldn't work. Yes, though other frequent lenders like India had refused. Yes, though Sri Lanka's debt was ballooning rapidly under Mr. Rajapaksa.

Over years of construction and renegotiation with China Harbor Engineering Company, one of Beijing's largest state-owned enterprises, the Hambantota Port Development Project distinguished itself mostly by failing, as predicted. With tens of thousands of ships passing by along one of the world's busiest shipping lanes, the port drew only 34 ships in 2012.

And then the port became China's.

Mr. Rajapaksa was voted out of office in 2015, but Sri Lanka's new government struggled to make payments on the debt he had taken on. Under heavy pressure and after months of negotiations with the Chinese, the government handed over the port and 15,000 acres of land around it for 99 years in December.

එකී පුවත පදනම් කරගනිමින් මෙම සමාගමට එරෙහිව නඩු පවරන බවට මෙම දේශපාලන පක්ෂය මෙන්ම එවක බලයේ සිටි පක්ෂය ද මාධ්‍ය හමු පවත්වා අවධාරණය කළ ද අද දක්වාම එවැනි නඩුවක් හෝ පැමිණිල්ලක් හෝ විමර්ශනයක් සිදු වී නැත්තේ ඇමෙරිකානු මාධ්‍ය පුවත සම්පූර්ණ අසත්‍යයක් බැවිනි.

කොළඹ වරාය නගරය බිහිකිරීමට ආයෝජන සිදු කිරීම විනා ඒ සඳහා වන පනත සම්බන්ධයෙන් ව්‍යාපෘති සමාගමට රජය වෙත බලපෑමක් සිදු කල නොහැකිය. මෙම නගරය සඳහා වන පනත සැකසීම ආරම්භ වූයේ පසුගිය පාලන සමය වන 2016 දි වන අතර ඔවුන්ගේ මූලිකත්වයෙන් සකසන ලද පනත් කෙටුම්පත අවස්ථා දෙකකදී නීතිපති දෙපාර්තමේන්තුව ප්‍රතික්ශේප කරන ලද්දේ එය රටේ මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පවා අභිබවා යන තරම් ප්‍රබල වීම හේතුවෙනි.

ඒ අනුව ගත්කල දැන් ඉදිරිපත් කර ඇත්තේ පෙර කෙටුපත් දෙකට සාපේක්ෂව බලය අඩු පනතකි.







## මිථ්‍යා මතය

ආයෝජන මණ්ඩල පනත සහ ක්‍රමෝපාය සංවර්ධන පනත ලෙස අපේ රටේ සම්මත වූ පනත් දෙකක් තිබෙනවා. ඒ පනත්වලින් විශාල ලෙස බදු සහන ලබා දිය හැකියි. රාජපක්ෂලා ෂැන්ග්‍රිලා හෝටලයට වසර 25කට බදු සහන ලබා දුන්නේත් රනිල්ලා හම්බන්තොට වරාය විකිණීමේදී චීන සමාගමට බදු සහන ලබාදුන්නේත් ඒ යටතේයි. එසේ තිබියෙදී එම පනත් ක්‍රියාත්මක නොකර වරාය නගරයට අදාළ කොමිෂන් සභාවක් යටතේ වෙනම ප්‍රාතයකකට අදාළ තරම් විශාල වරප්‍රසාද ප්‍රමාණයක් ලබා දී තිබෙනවා.

## සත්‍යය

ආයෝජන මණ්ඩල පනත නැතහොත් මහ කොළඹ ආර්ථික කොමිසම මේ වන විට වසර 43 ට වඩා පැරණි පනතකි. ඒ මගින් එකල ඉලක්ක ගත වූයේ නිෂ්පාදන මත පදනම් වූ ආයෝජන උදාහරණ ලෙස නිමි ඇඳුම්, රබර් නිෂ්පාදන, එකලස් කිරීම් ආදිය දිරි ගන්වා ඒ ක්ෂේත්‍ර සඳහා විදෙස් ආයෝජන ආකර්ශනය කර ගැනීමයි. ක්‍රමෝපායි සංවර්ධන පනත 2008 දී හඳුන්වා දෙන ලද්දේ ආයෝජන මණ්ඩල පනතින් ආවරණය නොවුන සේවා හා වාණිජ්‍ය ආයෝජන ආකර්ශනය කර ගැනීම සඳහායි.

වරාය නගරය මූල්‍යතන හා සේවා ක්ෂේත්‍රය ඉලක්කගත කරගත් ව්‍යාපෘතියක් බැවින් ඊට ආවේනික නීති රාමුවක අවශ්‍යතාව කාලානුරූපිව ගොඩනැගී ඇත.

## මිථ්‍යා මතය

එම වරාය නගරය කිසිදු පළාත් පාලන ආයතන බල ප්‍රදේශයකට අයත් නොවන විශේෂ කලාපයක් වනවා.

## සත්‍යය

ආයෝජන මණ්ඩලයට අයත් කලාප වසර 43ක් තිස්සේ එහි පාලනය යටතේ ක්‍රියාත්ම වෙයි. මෙය දීර්ඝ කාලයක් තිස්සේ සිදුවන දෙයක්. ඒ නිසා මේ කාරණය අලුත් දෙයක් නෙමෙයි.

පළාත් පාලන ආයතන හා එහි අකාර්යක්ෂමතා පිළිබඳ පක්ෂ විපක්ෂ භේදයකින් තොරව දැඩි කතාබහක් පවතින කාලයකි. ඒ සඳහා වන සුදුසු විකල්ප පිළිබඳ කතාබහක් පවතින කාලයකි. වරාය නගරය මේ ඕනෑම අත්හදා බැලීමක් සඳහා සුදුසුම පරිසරය නිර්මාණය කර දෙයි.

## මිථ්‍යා මතය

පළාත් පාලන ආයතන ප්‍රදේශ පාලනය වන්නේ එහි ජීවත්වන ජනතාවගේ ඡන්දයෙන් පත්වූ මහජන නියෝජිතයින් මගිනුයි. එහෙත් වරාය නගරය පාලනය වන්නේ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන කොමිෂන් සභාවක් මගිනුයි.

## සත්‍යය

මෙරට ජනාධිපතිවරයා පත් වනු ලබන්නේත් මහජන ඡන්දයෙනි.

## මිථ්‍යා මතය

එම කොමිෂන් සභාවේ නියෝජිතයන්ට කිසිවක් කිරීමක් වෙනුවෙන් හෝ නොකර හැරීමක් වෙනුවෙන් අධිකරණයේ නඩු පැවරිය නොහැකි මුක්තියක් ලැබෙනවා. එය ජනාධිපතිවරයාට සමාන ආකාරයේ නොවූවත් එවැනි මුක්තියක්.

## සත්‍යය

එකී මුක්තිය මෙම පනතට අදාල කටයුතු සඳහා පමණක් බල පැවැත්වේ. ඒ මුක්තිය කවර ආකාරයේ අපරාද වරදක් හෝ මේ පනතේ කටයුතු හිතාමතා පැහැරහැරී අවස්ථාවන් වලදී හෝ රටේ පිළිගත් වෙනත් නීති උල්ලංඝණයකදී කිසිසේත්ම අදාල නොවේ.

## මිථ්‍යා මතය

මෙම කොමිෂන් සභාවට විශේෂ මූල්‍යව  බලතල ලැබෙනවා. කොමිසමට වෙනම අරමුදලක් පවතිනවා. රාජ්‍ය ආදායම් එකතුවන්නේ ඒකාබද්ධ අරමුදලටයි. එයින් මුදල් ලබාගැනීමට පාර්ලිමේන්තුවේ අනුමැතිය අවශ්‍යයි. එහෙත් වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවට එයින් පරිබාහිරව පාර්ලිමෙන්තු අනුමැතිය අවශ්‍ය නොවන වෙනම අරමුදලක් පවත්වා ගෙන යා හැකියි.

## සත්‍යය

ඕනෑම රාජ්‍ය ආයතනයකට, කොමිසමකට ස්වකීය අරමුදල් පවතින ආකාරයටම වරාය නගර කොමිසමටත් අරමුදලක් පැවතීම සාමාන්‍ය  දෙයකි.

අනෙක් රාජ්‍යමය  ආයතන මහජන බදු මුදලින් නැතහොත් පාර්ලිමේන්තු අවසරයෙන් මුදල් ලැබුවද, වරාය නගර කොමිසම ස්වකීය අරමුදල් ප්‍රධාන කොටම විදෙස් ආයෝජන වලින් උපයා ගෙන එය රජය වෙත ලබා දීමේ වෙනස් ක්‍රමවේදයකින් ක්‍රියාත්මක වීමට නියමිතය. කොමිසම රටේ ජනාධිපතිවරයාට සහ ඔහු නම් කරන අමාත්‍යවරයෙකුට  වග කියන බැවින් අවසානයේ එය රටේ මහජනතාව වෙත සිදු වන වගවීමකි.

## මිථ්‍යා මතය

වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවට විවිධ බදු සහන ලබාදීමේ බලය හිමියි. සාමාන්‍යයෙන් බදු සහන ලබා දිය හැක්කේ පාර්ලිමේන්තුවට පමණයි. නමුත් මෙම 'ප්‍රාන්තය'ට විශේෂ බදු සහන බලය හිමියි.

## සත්‍යය

කොමිසම විසින් නිර්දේශ කර සකස් කරන ඕනෑම බදු සහනයක් බලාත්මක වීමට නම් එය අනිවාර්යයෙන්ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුමය.





## මිථ්‍යා මතය

රාජ්‍යයට ලැබෙන මුදල් විගණකාධිපතිගේ අධීක්ෂණයට යටත් වෙනවා. එහෙත් වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ මුදල් විගණනය කරනු ලබන්නේ පෞද්ගලික ආයතනයක් විසිනුයි. එය රාජ්‍ය විගණනයෙන් ඉවත් කරනු ලැබ තිබෙනවා.

## සත්‍යය

ව්‍යවස්ථාවේ 154 වගන්තියට ප්‍රකාරව විගණන කටයුතු පිළිගත් දේශීය හෝ ජාත්‍යන්තර අධීක්ෂණ අවශ්‍යතාව පෙන්වා දී ඇත.

අවසන් විගණන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බැවින් එය හොඳින් අධ්‍යනය කිරීමේ හැකියාව මහජන නියෝජිතයින්ට ලැබේ.

## මිථ්‍යා මතය

රාජ්‍ය ආයතන පාර්ලිමේන්තුවේ කෝපා (COPA) සහ කෝප් (COPE) හමුවට කැඳවනු ලැබිය හැකියි. එහෙත් මේ 'චීන ප්‍රාන්ත' පාලනය පාර්ලිමේන්තුව හමුවට කැඳවිය නොහැකියි.

## සත්‍යය

කැඳවිය නොහැකි බවට සඳහනක් නැත.

මහජන මුදල් වලින් නොයැපෙන ආයතනයක් ලෙස ගොඩනැංවීමට අපේක්ෂිත ආයතනයක් බැවින් පාර්ලිමේන්තුවට වඩා සෘජු වගවීම ඇත්තේ ජනාධිපතිවරයා වෙත හෝ නම් කරන ලද අමාත්‍යවරයෙකුට වේ.

## මිථ්‍යා මතය

මෙම වරාය නගරය තුළ ආයෝජනය කළ හැක්කේ විදේශිකයන්ටයි. එය ශ්‍රී ලංකාවේ ව්‍යාපාරිකයන්ට ආයෝජනය කිරීම වක්‍ර ලෙස වළක්වා තිබෙනවා. ඒ අරමුදල් විදේශයන්ගෙන් සම්පාදනය කරගන්නා අයෙකුට පමණක් මෙහි ආයෝජනය කළ හැකි බව දන්වා සිටීමෙනුයි. එහි තේරුම මෙම වෙනම ප්‍රාන්තයක් වීමයි.

## සත්‍යය

දේශීයව හෝ විදේශීයව වේවා ඕනෑම විදිහකින් අරමුදල් සම්පාදනය කරගත හැකිව තිබුනා නම් මෙරට ව්‍යාපාරිකයින් සේම මෙරට සිට ක්‍රියාත්මක විදෙස් ව්‍යාපාරිකයින් පවා මෙරට තුල ඇති මුදල් සංචිත විදෙස් මුදල් වලට මාරු කර හෝ තම විදෙස් ව්‍යාවහාර මුදල් වලින් මෙරට බැංකු තුළ පවත්වාගෙන යන මුදල් ඉතා සීඝ්‍ර ලෙස වාරය නගරය වෙත සම්ප්‍රේෂණය කිරීමට ඉඩ තිබුනි.

නමුත් මෙම කොන්දේසිය මගින් දේශීය හෝ විදේශීය ඕනෑම ව්‍යාපාරිකයෙකු විදෙස් සංචිත අනිවාර්යයෙන්ම විදේශ රටක සිට රැගෙන ආ යුතුය. එමගින් නියත ලෙසම විදෙස් ආයෝජන මෙරටට ලැබීමේ ප්‍රවණතාව ඇති වේ. මේ වන විටත් ඇතැම් දේශීය සමාගම් තමන් සතු විදේශ මුදල් මෙරටට නොගෙන්වා සිංගප්පූරුව, හොංකොං හෝ ඩුබායි වැනි නගර වල මෙම යෝජිත පහසුකම් ඇති බැංකු තුල තැන්පත් කර පවත්වාගෙන යමින් සිටී.

වාරය නගර කොමිසම බිහිවීමෙන් පළමු කොටම ප්‍රතිලාභ ලැබෙනුයේ එසේ විදෙස් සංචිත රටින් පිට තැන්පත් කර සිටින දේශීය ව්‍යාපාරිකයන් වෙතය.

## මිථ්‍යා මතය

මෙම වරාය නගර කලාපය තුළ සේවය කරන අයට වැටුප් ගෙවිය යුතු වන්නේ නම් කරන ලද විදේශීය මුදලකින් බව ප්‍රකාශ කරනවා. එය චීන 'යුවාන්' විය හැකියි.

## සත්‍යය

**ලෝකය පිළිගත් ඕනෑම ව්‍යවහාරික මුදල් ඒකකයකින් වැටුප් පමණක් නොව භාණ්ඩ හා සේවා මිලදී ගැනීමටත් ලබා දීමටත් වරාය නගරය තුළ හැකි වනු ඇත.**

එය ශ්‍රී ලංකා හෝ ඉන්දීය රුපියල් පමණක් නොව යුරෝ, පවුම්, ඩොලර්, යෙන්, ඩිනාර්, රූබල් ඕනෑම ඒකකයක් විය හැකිය.

## මිථ්‍යා මතය

මෙහි සේවය කරන්නවුන්ගේ ආදායම්, ආදායම් බදුවලින් නිදහස් කරනු ලැබ තිබෙනවා. එම මුදල් මෙරට විදෙස් ව්‍යවහාර ගිණුමක තැන්පත් කළ හැකි බව ප්‍රකාශ කරනු ලබනවා.

## සත්‍යය

**විදෙස්ගතව විදේශ විනිමය ඉපයීම වෙනුවට මෙරට සිට උසස් වෘත්තීන්වල නිරත වෙමින් විදේශ විනිමය ඉපයීමේ යුගයක්** බිහිවීමේ මූලික අඩියර.

## මිථ්‍යා මතය

ශ්‍රීලංකා පුරවැසියන් කොළඹ වරාය නගරයේ සේවා මුදල් ගෙවා ලබා ගත හැකි වුවත් එයින් පිටව යද්දී මිලදී ගත් භාණ්ඩවලට බදු ගෙවිය යුතු වෙනවා. මෙයින් මෙම කලාපය වෙනම රටක් බවට ඒත්තු ගන්වනවා.

## සත්‍යය

බදු සහන හිමිවන්නේ සංචාරක වීසා සහිත වලංගු පිටත්වීමේ ගුවන් ටිකට්පත් සහිත වූවන්ට විනා ඕනෑම අයෙකුට නොවේ.. එසේ නොවුනහොත් රටේ අනෙක් ප්‍රදේශ වල ලබා දෙන සේවා හා භාණ්ඩ අලෙවිය බිඳවැටීමකට ලක්විය හැකිය.

**රටේ සමස්ත සේවා හා භාණ්ඩ අලෙවිය ආරක්ෂා කරගනිමින් සංචාරකයින් සඳහා වඩා උසස් හා තරඟකාරී භාණ්ඩ හා සේවා ලබා දීමට මෙමගින් හැකි වේ.**

මෙම පනතින් වෙනම රටක් බිහි වෙතැයි යම් කිසිවෙකු හට සැකයක් ඇත්නම් ශ්‍රේෂ්ඨාධිකරණයට ගොස් නිරවුල් කරගත හැක.





## මිථ්‍යා මතය

වරාය නගරය ආර්ථික කොමිෂන් සභා බල ප්‍රදේශය තුළ ආරවුල් විසඳා ගත යුත්තේ ජාත්‍යන්තර බේරුම්කරණයෙනුයි. නිදසුනක් ලෙස තෙල් සංස්ථාව හා ජාත්‍යන්තර සිටි බැංකුව සමග ඇතිකර ගත් හෙජිං ගිවිසුම පිළිබඳ ආරවුල සිංගප්පූරු බේරුම්කරණ මණ්ඩලයකට යොමු වුණා. ඒ රාජ්‍යයන් අතර ආරවුල් විසඳා ගන්නා ක්‍රමයයි. ඒ අනුව කොමිෂන් සභාව හා ආයතන අතරත් ආයතන සහ සේවකයන් අතර ඇතිවන ආරවුල් එහි පිහිටුවනු ලබන ජාත්යින්තර බේරුම්කරණ මණ්ඩලයකට පැවරෙනවා.

## සත්‍යය

එවැනි බේරුම්කරණ මධ්‍යස්ථාන බිහිවීමෙන් පෙන්නුම් කරනුයේ දියුණු ජාත්‍යන්තර තලයේ නගරයක් බවට කොළඹ වරාය නගරය පත්වීමේ මුල් පියවරයි.

## මිථ්‍යා මතය

එපමණක් නෙවෙයි, දැනට පාර්ලිමේන්තුවේ සම්මත කොට තිබෙන ඉතාමත් වැදගත් පනත් ගණනාවක් මෙම ප්‍රාන්තය තුළ ක්‍රිත්මක වෙන්නේ නැහැ. ඉදිකිරීම් පිළිබඳ අනුමැතිය ලබාදෙන ජාතික රාජ්‍ය සභාවේ අංක 78 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනත, මහ නගර සභා ආඥා පනත, ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථාන පනත, නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත, විවිධ ව්‍යාපෘති සඳහා බදු සහන ලබාදෙන ක්‍රමෝපායික සංවර්ධන පනත, පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත, ආයෝජන මණ්ඩල පනත, සුරැකුම් හා විනිමය කොමිසන් සභා පනත වැනි වැදගත් පනත් මේ ප්‍රාන්තය තුළ ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

සුරැකුම් හා විනිමය කොමිසන් සභා පනත මගින් තමයි විදෙස් විනිමය ආරක්ෂා කරගෙන තිබෙන්නේ. එම රටේ විදෙස් මුදල් පිළිබඳ සියලු බලතල හා රෙගුලාසි ක්‍රියාත්මක වෙන්නේ මෙම පනත හරහා.

එමෙන්ම ආදායම් බදු පිළිබඳ නීති රෙගුලාසි ඇතුළත් දේශීය ආදායම් පනත, එකතු කළ අගය මත බදු පනත, 2002 අංක 11 දරණ මුදල් පනත, 2005 අංක 05 දරණ මුදල් පනත, භාණ්ඩ ආනයන අපනයන පිළිබඳ බලය තිබෙන රේගු ආඥා පනත, වරාය හා ගුවන්තොටුපල බදුවලට අදාල වරාය හා ගුවන්තොටුපල සංවර්ධන පනත, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත, ඔට්ටු ඇල්ලීම හා සූදු පනත, හිතු පරිදි සමාගම්වල කැමැත්ත පරිදි සේවකයින් සේවයෙන් පහ කිරීමට නොහැකි සහ සේවකයින්ට අදාල අයිතිවාසිකම් ආරක්ෂා වෙන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ පනත, විනෝද බදු පනත, විදෙස් විනිමය පනත, කැසිනෝ ව්‍යාපාර නියාමනය කිරීමේ පනත යන පනත් සියල්ල මුළුමනින්ම නිදහස් කිරීමට හෝ යම් යම් වගන්ති සංශෝධනය කර දීමට ආණ්ඩුව කටයුතු කරනවා.

එනිසා සැලසුම් සකස් කරමින් තිබෙන්නේ මෙම වරාය නගරය චීන ප්‍රාන්තයක් කිරීමටයි. චීනයට හොංකොං පිලිබඳ සැලැස්මට සමාන සැලැස්මක් තමයි වරාය නගර ව්‍යාපෘතිය සම්බන්ධයෙන් තියෙන්නේ.

## සත්‍යය

වරාය නගරය වෙනුවෙන් අදාළ පනත් 07හි බලතල පැවරෙන්නේ කොමිසමට. මෙමගින් කොමිසමේ බලතල වඩාත් ශක්තිමත් කරමින් මේ පිලිබඳ කටයුතු කිරීමේ වගකීම පවරා තිබෙනවා. ආයෝජන මණ්ඩල පනතින් පමණක් විවිධ අනපනත් 33 ක් මේ ආකාරයෙන්ම සෘජු ලෙස BOI ආයතනය යටතට පවරා තිබෙනවා.

හොංකොං යනු ඓතිහාසික සාධක අනුව පුරාණ චීන අධිරාජ්‍යයේම කොටසකි. එය 1842 වසරේදී බ්‍රිතාන්‍යයන් විසින් බලහත්කාරයෙන් අල්ලාගන්නා ලදුව පසුව විවිධ උපක්‍රම මගින් අබිං යුධ සමයේදී කූට ලෙස පාලනය කොට පසුව 1898 වසරේදී 99 අවුරුද්දක් සඳහා චීන අධිරාජ්‍යයාගෙන් බදු පදනම ලෙස ගන්නා ලද අර්ධද්වීප භූමියකි.

99 අවුරුදු බද්ද අවසන් වූ 1997 වසරේදී අකමැත්තෙන් වුවද යළි චීනය වෙත හොංකොං කලාපය ලබා දීමට බ්‍රිතාන්‍යයන්ට සිදු වූයේ ඔවුන් ලෝකය හමුවේ බැටළුහම් පොරවාගත් වෘකයින් සේ වසර 150 ට අධික කාලයක් ඒ කලාපයේ ධනය හා ස්වභාවික සම්පත් සූරාකා තිබූ පසුබිමකය. නමුත් වසර 150 ක් තිස්සේ බ්‍රිතාන්‍යයන් හොංකොං තුල ක්‍රියාත්මක කළ පාලන ක්‍රමය එක රැයින් වෙනස් කිරීමට චීන බලධාරීන් කටයුතු කළේ නැත.

එය එක රටක ක්‍රම දෙකක් යන සංකල්පය ඔස්සේ සිදු කිරීමට ඔවුන් කටයුතු කලත් අදටත් බ්‍රිතාන්‍යයන් විසින් බිහිකරන ලද බටහිර ලැදි නූතන හොංකොං පරම්පරාව නිරන්තරව උසි ගන්වමින් හොංකොං කලාපය අස්ථාවර කිරීමේ සාහසික ක්‍රියාවේ බ්‍රිතාන්‍යයන් නිරත වේ. නූතන සමාජවාදයේ සුපිරි ආදර්ශය වන චීනය පසෙකලා අන්ත ධනේෂ්වර බ්‍රිතාන්‍යයේ ක්‍රියාකලාපයට ආවැඩීම විමතිය දනවන කරුණකි.

## මිථ්‍යා මතය

ජනාධිපතිවරයා විසින් පත්කරන කොමිසන් සභාවේ සාමාජිකයින් ශ්‍රීලංකා පුරවැසියන් පමණක් විය යුතු බව කොතනක හෝ සඳහන් වෙන්නේ නැහැ. එනිසා කොමිසන් සභාවේ සාමාජිකයින් චීන ජාතිකයින්ද යන්න සැකයක් තිබෙනවා. මේ ආණ්ඩුවේ ආවේ දේශප්‍රේමී, ජාතික සම්පත් ආරක්ෂා කරන ආණ්ඩුවක් විදියට.

ලිබර් ආර්ථිකය පිළිබඳ විශාල විවේචනයක් ගොඩනගන ලද පාලනයක්. ආර්ථික ලිබරල්කරණයේ ප්‍රධාන අංගයක් තමයි ආයෝජන මණ්ඩල සහ ක්‍රමෝපායික සංවර්ධන පනත. ජනාධිපතිවරයා විසින් ජනාධිපතිවරණයේදී ඉදිරිපත් කරන ලද ලිබරල් ආර්ථිකයට එරෙහි මතය ජාතික ආර්ථිකය පිළිබඳ වහසිබස් බවට පත්කරමින් රටේ අන පනත් අහෝසි කරමින් ආර්ථිකය නිදහස් මකිරීමට නියමිතයි.

## සත්‍යය

ලෝකයේ බොහෝ රටවල විවිධ රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතන වල අති දක්ෂ ශ්‍රී ලාංකිකයින් සේවය කරන පුවත් නිතර අසන්නට ලැබේ. එවැනි රටෙන් අහිමිව ගිය විශිෂ්ඨ බුද්ධිමතුන් යළි මවුරටට ගෙන්වා ගැනීමට හැකි අනගි අවස්ථාවක් ලෙස ධනාත්මකව ද ඒ දෙස බැලිය හැකිය.





# පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත.

## සාරාංශය :

මේ සියලු ප්‍රායෝගික කරුණු හමුවේ පැහැදිලි වන සමස්තය ලෙස මෙසේ ගොනු කර දැක්විය හැකිය.

## වරාය නගරය චීන කොලනියක් නොවෙයි!

කොළඹ වරාය නගරය චීන කොළනියක් බවට පත්වන බව ඇතමුන් පැවසීම සම්පූර්ණයෙන්ම අසත්‍යක්

## කොමිෂන් සභාව පිහිටුවන්නේ,

ආයෝජකයන්ගේ පහසුව සඳහා සියලු රාජ්‍ය ආයතන එක් ස්ථානයකින් සම්බන්ධීකරණය කිරීම වෙනුවෙන් නව කොමිෂන් සභාව පිහිටුවනු ලබනවා.

ඒ අනුව මෙම කලාපයට පිවිසෙන විදේශකයින්ට වීසා ලබා දීම බැංකු බලපත්‍ර ලබා දීම ඇතුලු අනෙකුත් සේවා අදාළ ශ්‍රී ලංකා රජයේ ආයතන විසින් මෙරට නිතීයට අනුව සිදුකරනවා.

## වරාය නගරයේ පාලනය කරන්නේ,

කොමිසමේ සමාජිකයින් ජනාධිපතිවරයා විසින් පත් කරන නිසා වරාය නගරයේ පාලනය ශ්‍රි ලංකාව යටතේ පවති. එම සමාජිකයින් ඕනැම අවස්ථාවක ඉවත් කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත. සමාජිකයින් වරදක් කළහොත්  ඔවුන්ව මෙරට අධිකරණය හමුවට ඕනෑම අවස්ථාවක පැනවිය හැක.

## වරාය නගරයේ ආයෝජනය කරන්නේ විදේශිකයන් විතරද?

නැත. ඕනෑම රටක ව්‍යාපාරික සමාගමක් ආයෝජනය කළ හැකියි. දැනටමත් ශ්‍රී ලාංකික සමාගමක් මෙහි පළමු සංවර්ධන ව්‍යාපෘතියට ආයෝජන කිරීමට ඉදිරිපත්වී සිටියි. එම ආයෝජකයින් දිරි ගැන්වීමට බදු සහන සහ ඇතැම් නිතී ඉවත් කර ඇත.

## රුපියලින් ගෙවන්න පුලුවන්

වරාය නගරය තුල ඇතැම් ගනුදෙනු රුපියල් වලින් කළ හැකිවුවත්, විනිමය අනුපාතය අනුව විදේශ ව්‍යවහාර මුදල් භාවිතයේදී සුලු ගාස්තුවක් අය වෙන්න පුලුවන් වෙනත් මුදල් හුවමාරු වෙන නිසා.

## ශ්‍රී ලාංකිකයන්ට රැකියාකළ හැකියි

ඕනැම ශ්‍රී ලාංකිකයෙකුට වරාය නගරය තුල රැකියා කළහැක. ඔවුන්ට වැටුප් ගෙවන්නේ විදේශ මුදල් වලිනි. එම වැටුප් මෙරට බැංකු ගිණුම් වලතැන්පත් කළ හැකි අතර එය බදු වලින් නිදහස් කරනු ඇත.

## වරාය නගරේ පොලිසිය,

ශ්‍රී ලංකා පොලීසිය වරාය නගරයේ නිතීය බලාත්මක කරන අතර එහි නඩු කටයුතු ශ්‍රී ලංකා උසාවිය තුළ විභාග කෙරේ.

## කොළනියක් නොවන ප්‍රාන්තයක් නොවන අපේම රටේ අපේම සංවර්ධනයට පුරවැසි අපිට වීසා මොකටද?

ඕනම කෙනෙකුට වෙරළ පාගන්න බඩු ගන්න එන්න පුලුවන්. කිසිම ප්‍රශ්නයක් නෑ. වීසා ඕන නෑ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය රට තුළ ආරම්භ කරන විටත් රට වෙනම පාලනයකට අයත් වන බවත් රැකී රක්ෂා අහිමි වන බවටත් අසත්‍ය ප්‍රචාර ගණනාවක් පැතිරී තිබිණි. නමුත් අද වන විට ආයෝජන මණ්ඩලය හරහා රට තුළට එන විදේශ ආයෝජනය හරහා ජනතාවට ඉමහත් ඵළ නෙලා ගන්නට හැකි වී තිබීම තුළින් එදා මතු වූ අසත්‍ය කරුණු අදවන විට බිඳී ගොස් ය.

එසේම කන්ටේනර් රටට ගෙන්වන අවස්ථාවේදී ”කන්ටේනර් මාරයා” ලෙස හඬ නගමින් ලොරි රථ රියදුරන්ගේ රැකියා අහිමි වේ යැයි මිථ්‍යාවන් ප්‍රචාරය කෙරිණි. නමුත් එසේ සිදු වූයේ නැත. රැකියා කිසිවකට හානි වී නැත.

කොළඹ වරාය නගරය ළඟ බලන්නෙකුට බිල්ලක් ලෙස පෙනෙයි. නමුත් දුර බලා වැඩ කරන බුද්ධිමත් ශ්‍රී ලාංකික ජනතාවට ශත වර්ෂ ගණනාවක අනාගත ආර්ථික හැරවුම් ලක්ෂය ලෙස මෙය සපත වනු ඇත.








ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානය
தேசிய அபிவிருத்திக்கான ஊடக நிலையம்
Media Centre for National Development

ජනමාධ්‍ය අමාත්‍යාංශය
வெகுஜன ஊடக அமைச்சு
Ministry of Mass Media

Ministry of Mass Media
163,Asi Disi Medura, Kirulapone Mawatha, Polhengoda,
Colombo 05. Sri Lanka
info@mcnd.gov.lk | www.mcnd.gov.lk